# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2447/81 - 2025 අගෝස්තු මස 02 වැනි සෙනසුරාදා - 2025.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ හොරණ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන හොරණ නගර සභාවේ තෝරාළුවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ හොරණ නගර සභාව සඳහා තෝරාළුවා ඇති සභිකයෙකු ලෙස පත් වූ සන්දනම් ජෝන්සන් පෝල් අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම හොරණ නගර සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා රජීව වාසුල ගුණසේකර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

හොරණ නගර සභාවේ තේරීම්භාර නිලධාරි, වන්නකුවත්ත වඩුගේ කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් රජීව වාසුල ගුණසේකර, හොරණ නගර සභාවේ තෝරාළුවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු,**
තේරීම්භාර නිලධාරි,
හොරණ නගර සභාව.

2025 ජුලි මස 31 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කළුතර.

EOG 08 - 0041

1A - G 45045 — 09 (2025/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*